**වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව**

**වවුනියාව දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 20**20**පෙබරවාරි **28** දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2020 ජූනි 22 දින හා 2020 ජූලි 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වන උප වගන්තියට අනුව, මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. |

**(ආ) ගණකාධිකරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- | --- |
| (i) | වත්කම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. | වත්කම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. | එය අගය නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම ප්‍රකාශ නොවීය. ඊළඟ සමාලෝචන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර සකස් කරනු ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.214,170,673 ක් වූ ස්ථාවර වත්කම් සහ ඉඩම්වල වටිනාකම වෙන වෙනම පෙන්වා නැත. ක්ෂය කළයුතු වත්කම් ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ක්ෂය කිරීම සඳහා කටයුතු කළ යුතුය. | ක්ෂය කිරීම් විධිවිධාන අනාවරණය කර ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරණු ලැබේ. |
| (iii) | සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී ආදායම සභාව විසින් රු.785,469 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.3,319,406 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.4,104,875 ලෙස දක්වා තිබුණි. | නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා අදාල තැන්පතු පොළිය නිශ්චිත ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල දෝෂ ඉදිරි වර්ෂයේදී හෙළිදරව් කර නිවැරදි කරනු ලැබේ. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති රු.111,229,898 ක් වූ ස්ථාවර වත්කම් සඳහා සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සහතික කළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.111,229,898 ක් වූ ස්ථාවර වත්කම් සඳහා සාක්ෂි නියමිත වේලාවට විගණනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය | අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සභාව විසින් සිදු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව අපද්‍රව්‍ය කළමනාකරණයක ටයුතු සිදු කළ යුතුය. | ප්‍රදේශය තුළ ගෘහස්ථ අපද්‍රව්‍ය බැහැර කිරීම මෙතෙක් සිදු කර නොමැත. ව්‍යාපාර ආයතනවල, රාජ්‍ය ආයතනවල සහ වීදිවල නිසි අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන ආඥා පනත යටතේ බලාත්මක කරන ලද අතුරු ව්‍යවස්ථාවල XI සහ XII වගන්ති. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්මක් සකස් කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | වාර්ෂික අයවැයේ වෙන්වූ මුල්‍ය ප්‍රතිපාදන යටතේ අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කරනු ලැබේ. ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට පියවර ගනු ලැබේ. |
| (ඇ) | 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | පනතේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ජාතික පරිසර අධිකාරිය සමඟ කටයුතු කිරීමට පියවර ගනිමින් සිටී. |
| (ඈ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 32 රීතිය | සමාලෝචිත වර්ෂය සඳහා දේපල බදු තක්සේරුවට අදාල වාර්තා සභාව විසින් පවත්වා නොතිබුණි. | ප්‍රදේශීය සභා රීතියට අනුව ක්‍රියා කළ යුතුය. | අනාගතයේදී දේපල බදු එකතු කිරීමට හා තක්සේරු වාර්තා පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. |
| | (ii) 33 රීතිය | වරිපනම් බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි | ප්‍රදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉඩම් මැනුම් සිතියම සහ අයිතිකරුගේ තොරතුරු ලබා ගත් පසු, දේපල බද්ද ගණනය කර එකතු කිරීමට පියවර ගනු ලැබේ. |
| | (iii) 59 රීතිය | 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපාරික බදු අය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රදේශීය සභා නීතියට අනුව ක්‍රියා කළ යුතුය. | දැනට ව්‍යාපාර ආශ්‍රිත වැඩපිළිවෙළක් සකස් කරමින් පවතින අතර ව්‍යාපාර බදු අය කරනු ලැබේ. |
| | (iv) 218 රීතිය | අවම වශයෙන් වසරකට වරක්වත් භාරකරු විසින් ඉඩම් සහ ගොඩනැගිලි පරීක්ෂා කර නොතිබුණි. | ප්‍රදේශීය සභා නීතියට අනුව ක්‍රියා කළ යුතුය. | සභාවට ලබා දී ඇති ඉඩම් සඳහා ලියකියවිලි ලැබීමෙන් පසු අනාගතයේ දී වාර්ෂික පරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය. | | | |
| | XXIV වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය | පසුගිය වසර 06 තුළ නිලධාරීන් 02 දෙනෙකුට ලබා දී තිබුණු රු.94,384 ක ණය ආපසු අයකර ගැනීමට සභාව විසින් ඵලදායී පියවර ගෙන නොතිබුණි. | අදාළ නීති හා චක්‍රලේඛවල උපදෙස් අනුගමනය කරන්න. | අදාළ පුද්ගලයින් සම්බන්ධ කර ගැනීමට පියවර ගනිමින් සිටී. |
| (ඊ) | ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 891 | ඇප මුදල් ලේඛණයක් සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගත යුතුය. | තොරතුරු පිළිබඳ වාර්තාවක් තබා ගැනීමට උපදෙස් දෙනු ලැබේ. |
| (උ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක. 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වන ඡේදය. | වසරකට වරක් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කළ යුතු නමුත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛවල උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | වාහන ඉන්ධන පරීක්ෂා කිරීම සඳහා පියවර ගනිමින් සිටී. |
| (ඌ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක. IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගනක සහ එහි උපාංගවල ලේකණ යක් සභාව විසින් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛවල උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | පරිගණකය සහ එහි උපාංග පිළිබඳ වාර්තාවක් පවත්වා ගැනීමට පියවර ගනිමින් සිටී. |
| (එ) | 2017 ජුනි 28 දිනැති අංක. 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය. | නිශ්චල දේපල සම්බන්ධ වාර්තා නඩත්තු නොකරන අතර සභාවේ සියලුම වත්කම් ලේඛණගත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛවල උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ස්ථීර වත්කම් ලේඛණයක් පවත්වා ගැනීමට පියවර ගනිමින් සිටී. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,544,213 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,014,163 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| කුලී | 4,843,860 | 7,573,871 | 6,394,566 | 1,179,305 | 5,083,000 | 8,193,747 | 5,428,264 | 2,765,483 |
| බලපත්‍ර ගාස්තු | 401,000 | 300,591 | 300,591 | - | 940,000 | 793,166 | 793,166 | - |
| වෙනත් ආදායම් | 12,620,500 | 17,694,149 | 12,236,880 | 5,457,269 | 9,237,000 | 11,709,798 | 5,902,629 | 5,807,169 |
| එකතුව | **17,865,360** | **25,568,610** | **18,932,036** | **6,636,574** | **15,260,000** | **20,696,710** | **12,124,058** | **8,572,652** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආදායම් ණය ගැතියන්ගෙන් ලැබිය යුතු රු.23,581,351 ක මුදලක් අයකර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ ආදායම් අයකර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වැඩසටහන් මගින් අයකර ගැනීමට නියමිත මුදල් මේ වන විට අය කර ගනිමින් සිටින අතර අනෙකුත් රජයේ දෙපාර්තමේන්තුවලින් අය කර ගැනීමට කටයුතු කරමින් සිටී. |

**2.2.3 බදු කුලී**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පසුගිය වසර 05 ක කාලය තුළ රු.1,804,790 ක් වූ හිඟ බදුකුලී සභාව විසින් එකතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට සභාව පියවර ගත යුතුය. | හිඟ බදු කුලී අය කර ගැනීමට පියවර ගෙන තිබේ. |
| (ආ) | සභා සීමාව තුළ රු.348,335 ක් වූ හිඟ ඉඩම් කුලී ආදායම් පසුගිය වසර 02 තුළ සභාව විසින් එකතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගෙන තිබේ. |
| (ඇ) | රු.272,120 ක හිඟ වාහන කුලී මුදල් සභාව විසින් එකතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගෙන තිබේ. |

**2.2.4 වෙළඳ බලපත්‍ර කල්බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වසර 02 ක කාලය තුළ රු.12,583 ක් වූ හිඟ කල්බදු සභාව විසින් එකතු කර නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ කල්බදු හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | නීතිමය පියවර ගනු ලැබේ. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ව්‍යාපාර 39 ක් සඳහා ව්‍යාපාරික බලපත්‍ර නිකුත් කිරීමට සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ව්‍යාපාරික බලපත්‍රයක් නිකුත් කිරීමට සභාව පියවර ගත යුතුය. | මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශය ලැබීමෙන් පසු බලපත්‍රය නිකුත් කිරීමට පියවර ගනු ලැබේ. |

**2.2.6** **වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සාප්පු කුලී හිඟ මුදල් සම්බන්ධයෙන් දඩ මුදල් අය කිරීමට කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | දඩ එකතු කිරීමට පියවර ගත යුතුය. | ඉදිරියේදී දඩ මුදල් අය කිරීමට පියවර ගනු ලැබේ. |

**2.2.7** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ)** **උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දින පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් එකතු වටිනාකම රු.12,956,781 ක උසාවි දඩ මුදල් අය කර ගත යුතුව පැවතුණි. | නියමිත කාල සීමාවන් තුළ උසාවි දඩ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. | දඩ මුදල් ඉල්ලීම් කර අධිකරණයට ලිපි යවා ඇත. |

**(ආ)** **මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දින පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් එකතු වටිනාකම රු.400,000 ක මුද්දර ගාස්තු අය කර ගත යුතුව පැවතුණි. | නියමිත කාල සීමාවන් තුළ මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතුය. | මුද්දර ගාස්තු සඳහා ඉල්ලීම් ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහජන සෞඛ්‍ය, මහජන උපයෝගීතා සේවා සහ මහජන මංපෙත් විධිමත් කිරීම සහ සුවපහසුව, පහසුව සහ ජනතාවගේ සුභසාධනය වැනි කාරණා විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 28 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු විය. නමුත් 2019 දෙසැම්බර් 31 වන විට පවා අතුරු ව්‍යවස්ථා කාර්යයන් 19 ක් බලාත්මක කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | උතුරු පළාත් සභාව විසින් නිකුත් කරන ලද සියලු අතුරු ව්‍යවස්ථා භාවිතා කර ඇත. ඉතිරි අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින් සිටී. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. | සභාව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා නුදුරු අනාගතයේ දී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ඇත. |

(ඇ) **අපේක්ෂිත ප්‍රතිඵල ඉටුකර ගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මෙහෙයුම් කාර්ය සාධනය සඳහා රු .11,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර රු .1,879,154 ක් වියදම් කළ නමුත් රු.9,120,846 ක් වූ අපේක්ෂිත නිමැයුම ඉටුකර ගැනීමට නොහැකි විය. | හඳුනාගත් ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම ඉටු කළ යුතුය. | අයවැයේ සඳහන් ඇස්තමේන්තුගත ආදායම නොලැබීම හේතුවෙන්, හඳුනාගත් ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට ඔවුන්ට නොහැකි වී තිබේ. අමතර අරමුදල් ලැබී නොමැත. |

## (ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

ඝණ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරන ලදී.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | කසළ බැහැර කරන ස්ථාන සඳහා පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි ලෙස ස්ථාපිත කළ යුතු අතර අපද්‍රව්‍ය වෙන්කිරීම විධිමත් කිරීම හා ඒවා නැවත භාවිතා කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම මගින් පරිසරයට හානියක් නොවන පරිදි ක්‍රියාත්මක කිරීමෙන් ස්වාභාවික පොහොර නිපදවීමට පියවර ගත යුතුය. | ඉඩම් සඳහා සමීක්ෂණ සිදු කර අදාළ ලියකියවිලි නිකුත් කිරීමෙන් පසු පරිසර බලපත්‍ර නිකුත් කෙරේ. |
| (ii) | දිනපතා වීදි කසළ එකතු කිරීමේ වේලාවන් නියම කර නොමැති අතර මහජනයාට දැනුම් දී නොතිබුණි . | | වීදිවල කසළ එකතු කරන වේලාව පිළිබඳව නුදුරු අනාගතයේදී ජනතාවට දැනුම් දෙනු ලැබේ. |
| (iii) | සනීපාරක්ෂක කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර නොතිබුණි. | | සෞඛ්‍ය සේවකයින් සඳහා වාර්ෂික වෛද්‍ය පරීක්ෂණ නුදුරු අනාගතයේදී පවත්වනු ලැබේ. |
| (iv) | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අනුමත සනීපාරක්ෂක ක්‍රමවේදයන් සභාව භාවිතා කර නොතිබුණි. | | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අනුමත සනීපාරක්ෂක පිළිවෙත් භාවිතා කිරීමට පියවර ගනිමින් සිටී. |
| (v) | කුණු කසළ බැහැර කරන ඉඩම්වලට පශු සම්පත් පැමිණීම වැළැක්වීමට සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | කුණු කසළ බැහැර කරන ඉඩම්වලට පශු සම්පත් පැමිණීම වැළැක්වීමට ඉදිරි පියවර ගනු ලැබේ. |
| (vi) | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නිලධාරීන්ට කිසිදු පුහුණුවක් ලබා දී නොතිබුණි. | | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නිලධාරීන්ට නුදුරු අනාගතයේ දී පුහුණුව ලබා දෙනු ඇත. |
| (vii) | පාරිසරික කළමනාකරණයේ වැදගත්කම පිළිබඳව පාසල් සිසුන්ට සහ සාමාන්‍ය ජනතාවට සභාව විසින් උපදෙස් දී නොතිබුණි. | | ඉදිරි වර්ෂවලදී පාසල් සිසුන් විසින් පාරිසරික කළමනාකරණයේ වැදගත්කම මහජනතාවට දැනුම් දෙනු ඇත. |
| (viii) | සභාවේ අපද්‍රව්‍ය භාවිතයෙන් කාබනික පොහොර නිපදවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | අපද්‍රව්‍ය භාවිතයෙන් කාබනික පොහොර නිපදවීමට අනාගතයේ දී පියවර ගනු ඇත. |

| | | | |
|---|---|---|---|
| (ix) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු නීතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ අතුරු ව්‍යවස්ථා සභාව විසින් පනවා නොතිබුණු බැවින් අතුරු පනත බලාත්මක නොවීය. |
| (x) | අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. | | මෙම ව්‍යාපෘතිය නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කෙරේ. |

(ඉ) **තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක. A.S.General/2018/61 දරන චක්‍රලේඛයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සභාව සූදානම් වීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව පියවර ගත යුතුය. | අදාල ගැටළු අධ්‍යයනය කර නුදුරු අනාගතයේ දී තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පියවර ගනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු පත් නොකිරීම හේතුවෙන් උසාවි පිරිවැය ලෙස රු.961,133 ක මුදලක් ගෙවා තිබුණි. | සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු පත් කිරීමට පියවර ගත යුතුය. | සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට සහ උසාවි පිරිවැය අඩු කිරීමට අනාගතයේදී පියවර ගනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී වාහන 12 ක් සඳහා රු.4,065 ක දඩ මුදලක් ගෙවා තිබුණි. | නියමිත කාල සීමාව තුළ වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළයුතු අතර දඩ මුදල් වගකිවයුතු නිලධාරියාගෙන් අයකර ගැනීමට පියවර ගත යුතුය. | දඩ මුදල් නොගෙවා නියමිත වේලාවට ආදායම් බලපත්‍රය ලබා ගැනීමට අනාගතයේදී පියවර ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.37,564,503 ක් වූ සභාවේ ස්ථාවර තැන්පතු ශේෂ 10 ක් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමෙන් තොරව තැන්පතු ලෙස අඛණ්ඩව පැවතුනි. | ස්ථාවර තැන්පතු අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කළ යුතුය. | 2004 සහ 2005 වර්ෂවලදී ස්ථාවර තැන්පතු 06 ක් කිසිදු අරමුණකින් තොරව ආරම්භ කරන ලදී. අරමුණ ඉටු නොවීම හේතුවෙන් අනෙක් ස්ථාවර තැන්පතු 04 ක් අවසන් නොකරන ලදී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ පුරප්පාඩු නවයක් 2019 දෙසැම්බර් 31 දිනට පුරවා නොතිබුණි. | සේවක පුරප්පාඩු නියමිත කාල සීමාව තුළ පිරවිය යුතුය. | උතුරු පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම යවා ඇත. |
| (ආ) | පසුගිය වසර 06 ක කාලය තුළ සභාවේ නිලධාරීන් 02 දෙනෙකුට ලබාදී තිබුණු රු.94,384 ක ණය ආපසු අයකර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ නිසි පරිදි ණය අයකර ගැනීමට පියවර ගත යුතුය. | අදාළ පුද්ගලයින් සම්බන්ධ කර ගැනීමට පියවර ගනිමින් සිටී. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේපල මත අදාළ බදු ගණනය කර නොමැත. | අදාළ දේපල බද්ද ගණනය කළ යුතුය. | ඉඩම් මිනුම් සැලැස්ම සහ අයිතිකරුවන්ගේ තොරතුරු ලැබීමෙන් පසු දේපල බද්ද ගණනය කර නැවත අයකර ගැනීමට කටයුතු කෙරේ. |
| (ආ) | වර්ෂය තුල සභාව විසින් ලබාදුන් වටිනා රු.1,800,000 ක් වූ කොන්ත්‍රාත් වැඩ 18 ක් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත් කාලය තුළ වැඩ නිම කිරීමට පියවර ගත යුතුය. | කොන්ත්‍රාත් වැඩ ප්‍රමාද වීම වැළැක්වීමට පියවර ගනු ලැබේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් අංක. EP HR-2742 දරණ යතුරුපැදියක් සහ NP QR-6033 දරණ ත්‍රිරෝද රථ 2 ක් භාවිතයට ගත හැකි අයුරින් අළුත්වැඩියා කර භාවිතා කිරීමට මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාව අයත් පරිහරණය කරණු ලබන වාහන බැහැර කිරීමට හෝ අලුත්වැඩියා කිරීම සඳහා සුදුසු පියවර ගත යුතුය. | සභාවේ EP HR-2742 අංක සහිත යතුරුපැදිය අපහරණය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීමක් ප්‍රධාන ලේකම් වෙත යවා තිබේ. NP QR 6033 දරණ ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් සිටී. |

**3.5.2 අත්පත් කර නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් අනාවරණය කිරීම් සිදු කර නොතිබුණු අතර ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. ඉඩම් හා ගොඩනැගිලි නිතිපතා සත්‍යාපනය කිරීමෙන් සභාවට අයත් එවැනි වත්කම්වල අයිතිය සහතික කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල අයිතිය සභාවේ නමට පැවරීමට පියවර ගත යුතුය. | පල්ලියේ ඉඩම් හා ගොඩනැඟිලිවලට අදාළ හෙළිදරව් කිරීම් හා වාර්තා පවත්වා ගැනීමටත්, අනාගතයේදී ඉඩම් හා ගොඩනැගිලි නිසි පරිදි පරීක්ෂා කර බලා තහවුරු කර ගැනීමටත් පියවර ගනු ලැබේ. |
| (ආ) | සභාවට පරිත්‍යාග කරන ලද වාහන 04 ක අයිතිය පැවරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිමිකාරිත්වය සභාවට පැවරීමට පියවර ගත යුතුය. | එම වාහන 04 හි අයිතිය සභාවට පැවරීමට ඉදිරියේදී පියවර ගනු ඇත. |

**3.5.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු හදිසි ප්‍රතිසාධන ව්‍යාපෘතිය මගින් රු.26,137,591 ක වියදමින් ඉදිකර 2011 අගෝස්තු 12 දින සභාව වෙත භාරදෙන ලද බස් නැවතුම්පළක් භාවිතා කිරීම සඳහා සභාව විසින් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිකරන ලද බස් නැවතුම්පොළ අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. | නුසුදුසු ස්ථානයක බස් නැවතුම්පොළ පිහිටා තිබුණු බැවින් මිනිසුන් විසින් භාවිතය අඩු විය. නුදුරු අනාගතයේ දී බස් නැවතුම්පොළ සම්බන්ධයෙන් සුදුසු පියවර ගනු ලැබේ. |

**3.6 ප්‍රසම්පාදන**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.2,588,460 ක මිලදීගැනීම් තිබියදීත් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගත යුතුය. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉදිරි කාලය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලැබේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වර්ෂය සඳහා අයවැය ආදායම් ඇස්තමේන්තුව නිසි ලෙස සකස් නොකිරීම සහ තක්සේරුව නිසි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම නිසා අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම රු.100,409 සිට රු.5,781,190 දක්වා වෙනස් වී තිබුණි. | අයවැය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. | ඉදිරි කාලවලදී නිසි සැසඳීමක් කරමින් අයවැය සකස් කිරීමට උපදෙස් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයවැය වියදම් ඇස්තමේන්තු නිසි ලෙස සකස් කර නොතිබුණු අතර තක්සේරුව නිසි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් අයවැය වියදම් සහ තථ්‍ය වියදම් අතර වෙනස රු.1,038 ක සිට රු.5,029,511 ක් දක්වා වෙනස් විය. | අයවැය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. | ඉදිරි කාලවලදී නිසි සැසඳීමක් කරමින් අයවැය සකස් කිරීමට උපදෙස් දී ඇත. |

## 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------ |
| සභාවේ කටයුතු විධිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණක පත් කර ඇතත්, සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතුය. | අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් වූ කරුණු අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කෙරේ. |